විදුලි පණිවුඩ : " විශ්‍රාම වැටුප් " කොළඹ
தந்தி : "ஓய்வூதியம் " கொழும்பு
Telegrams : " PENSIONS " Colombo

දුරකථන / தொலைபேசி / Telephones: 2320316, 2421786, 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2342078

මගේ අංකය / எனது இல. / My No.: පීඑන්/4042 ඊ

ඔබේ අංකය / உமது இல. / Your No.:

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.

மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.

Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.

දිනය / திகதி / Date: 2005.12.16

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 11/2005**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## රජයේ විශ්‍රාම වැටුප් ගෙවීම බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීම.

ගරු රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි 2006 ජනවාරි මස සිට රජයේ විශ්‍රාම වැටුප් ගෙවීම බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීමට මෙම දෙපාර්තමේන්තුව විසින් තීරණය ර ඇත. මෙහි අරමුණවන්නේ විශ්‍රාමිකයනට තම විශ්‍රාම වැටුප කිසිදු බාධාවකින් තොරව බැංකු ගිණුම් තුළින් ලබා ගැනීමට අවස්ථාව සලසා දීමයි. ඒ සඳහා විශ්‍රාමික මහත්ම මහත්මීන්ගේ බැංකු ගිණුම්වලට මාසික විශ්‍රාම වැටුප සෘජුව බැර කරනු ඇත.

නව විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමය පහත සඳහන් උපදෙස්වලට අනුකූලව ක්‍රියාත්මක වේ.

01. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) විසින් සකස්කොට ඇති විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය නව පරිගණක වැඩසටහන සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් තම කාර්යාලවල පරිගණකයට ඇතුලත් කර ගත යුතුය.

02. මෙම නව පරිගණක වැඩසටහන මගින් මාසික විශ්‍රාම වැටුප් සකස් කිරීම සහ අනෙකුත් කටයුතු දැනට සිදුකරන ආකාරයටම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සිදු කල යුතුවේ.

03. මාසික විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය තොරතුරු ගොනුව (File) e-mail මගින් හෝ Diskette/ CD මගින් විශ්‍රාම වැටුප ගෙවීමට දින 04 කට පෙර SLIDA ආයතනය වෙත යැවිය යුතුය.

04. ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මහජන බැංකුව (people's bank), ලංකා බැංකුව (Bank Of Ceylon), ජාතික ඉතිරි කිරීමේ බැංකුව (NSB), හැටන් නැෂනල් බැංකුව (HNB), සම්පත් බැංකුව (Sampath Bank), සෙලාන් බැංකුව (Seylan Bank) , කොමර්ෂල් බැංකුව (Commercial Bank) සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව (Nations Trust Bank) වෙත චෙක්පත් ලිවීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත් නව ක්‍රමය නිසි පරිදි ක්‍රියාත්මකවීම තහවුරු වනතුරු ඉහත බැංකු සඳහාද යවනු ලබන ලේඛන (Pay Out Let Schedule) හා විශ්‍රාමිකයින්ට යවනු ලබන කුවිතාන්සි ඒ අයුරින්ම යැවිය යුතුය.

05. ඉහත බැංකුවලට අමතරව විශ්‍රාම වැටුප් ගෙවනු ලබන අනෙකුත් බැංකු සහ තැපැල් කාර්යාල සඳහා පෙර පරිදිම චෙක්පත් සහ අතිකුත් ලේඛන යැවීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය මුදල් දිසා ලේකම් කාර්යාල වෙතින් ලබා ගත යුතුය.

06. නව ක්‍රමය යටතේ 2006 ජනවාරි මස විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සම්පත් බැංකුව, සෙලාන් බැංකුව, කොමර්ෂල් බැංකුව සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකු ශාඛා වෙත විශ්‍රාම වැටුප් ලේඛන (Pay Out Let Schedule) යවන විට එම ලේඛනවල දෙවැනි පිටපත පෙර පරිදිම ආපසු ඔබ වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ එවන විට විශ්‍රාමිකයින්ගේ නම ඉදිරියෙන් ඔවුන්ගේ ගිණුම් අංකය ද සඳහන් කර එවන ලෙස උපදෙස් සහිත ලිපියක් ද බැංකු වෙත යැවීමට කටයුතු කළ යුතුය. එමෙන්ම බැංකු ගිණුම් නොමැතිව බැංකු තුලින් විශ්‍රාම වැටුප් ලබාගන්නා පුද්ගලයින්ට කඩිනමින් බැංකු ගිණුමක් විවෘත කරන ලෙස ද උපදෙස් දීමට කටයුතු කල යුතුය.

07. සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මෙම නව ක්‍රමයට අනුකූලව කටයුතු කල යුතු අතර මේ වන විට පරිගණක වැඩසටහන ක්‍රියාත්මක නොවන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතොත් ඒ බව වහාම මා වෙත ෆැක්ස් (Fax) මගින් දැනුම් දීමට කටයුතු කළ යුතුය.

08. නව ක්‍රමය යටතේ ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ මට්ටමෙන් මාසික විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණය පෙර පරිදිම මෙම දෙපාර්මේන්තුව විසින් ඔබ වෙත එවීමට කටයුතු කරනු ඇත.

09. මාසිකව නොගෙවන ලද විශ්‍රාම වැටුප් විස්තර හා චෙක්පත් පෙර පරිදිම (Pay Out Let Schedule) පිටපත් මගින් බැංකු වෙතින් ඔබ වෙත ලබා ගැනීමට කටයුතු සිදුකළ යුතුය.

මෙම විශ්‍රාම වැටුප් ගෙවීමේ නව ක්‍රමය සහ පරිගණක වැඩසටහන් පිළිබඳ මෙම දෙපාර්තමේන්තුව සහ SLIDA ආයතනය මගින් කඩිනම් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන බවද දන්වමි.

කේ.ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ

පිටපත්

1. ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
2. අයවැය අධ්‍යක්ෂ ජනරාල්
3. භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්
4. ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සම්පත් බැංකුව, සෙලාන් බැංකුව, කොමර්ෂල් බැංකුව සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකු ශාඛා කළමනාකරුවන්
5. විගණකාධිපති